**අපි වෙනුවෙන් අපි අරමුදල - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු , 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ ඇතුළත් කර ඇත.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | දුරකතන සමාගම් විසින් අරමුදලේ බැංකු ගිණුමකට බැර කරනු ලබන වටිනාකම මත පදනම්ව, සන්නිවේදන කුළුණු ආදායම හඳුනාගෙන තිබුණි. එබැවින් ගිවිසුම් අනුව අරමුදලට ලැබියයුතු වර්ෂයට අදාල ආදායමෙහි නිරවද්‍යතාවය තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් නොපැවතුණි. | ඍජුවම බැංකු ගිණුම වෙත බැර කරන ලද මුදලට අදාළව මූලාශ්‍ර ලේඛණ ලබාගැනීමට හා එම සමාගම් ඉදිරිපත් කරනු ලබන ලේඛණ අත්සන් සහිතව ගෙන්වා ගැනීමට ඉදිරියේදීකටයුතු කරනු ලැබේ. | නිවැරදිව ආදායම් හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව සත්‍ය වශයෙන් දැරීමට සිදුවන පරිපාලන වියදමෙහි ස්වභාවය, ප්‍රමාණය හෝ ගෙවියයුතු පාර්ශව නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව නිවාස ප්‍රතිලාභීන් වෙත ගෙවූ නිවාස ආධාර මුදලින් සියයට 2 ක් හෙවත් රු.12,132,959 ක්, 2023 දෙසැම්බර් 31 දිනට උපචිත පරිපාලන වියදම් ලෙස වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැර තිබුණු අතර වෙන්කිරීමක් ලෙස සලකා නොතිබුණි. | 2023 වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය මේ වන විටත් ක්‍රියාත්මක වන බැවින්, එහි එක් එක් අධියරයන් අවසන් වීමෙන් පසු පරිපාලන වියදමට අදාළ මුදල් ත්‍රිවිධ හමුදා සහ පොලීසිය වෙත අනිවාර්යෙන්ම නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාල පරිච්ඡේදයට අදාල සත්‍ය වියදම, උපචිත වියදම හා වෙන්කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වීම. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 90 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට ප්‍රමිතය ප්‍රකාරව අදාල කරුණු හෙළිදරව් කළ යුතු වුවත්, අරමුදලෙහි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය තුලින් රු.1,563,808 ක ප්‍රත්‍යාගණන ලාභයක් හදුනාගෙන ඇතත් ඉහත ගිණුම්කරණ ප්‍රමිතිය අනුව හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 90 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය සිදුකරන ලද මණ්ඩල වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 90 ඡේදය ප්‍රකාරව ගිණුම් මගින් අදාළ හෙළිදරව් කිරීම් සිදුකළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා 2010 සිට 2020 දක්වා වර්ෂයන්හිදි මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,071,546 ක්වූ පිත්තල සරනේරු, නිවාස විදුලි රැහැන් යෙදීමේ උපාංග ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍යය තොගයේ වටිනාකම, ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්ථාවර වත්කමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | මෙම ඉදිකිරීම් ද්‍රව්‍ය තොගයේ වටිනාකම, ජ'නල් සටහනක් මගින් නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | ගැණුම් පිරිවැය රු.4,150,000 වූ ලෝඩර් බැකෝ යන්ත්‍රයක් (Skid Steer Loader) 2023 මැයි 30 දින එලඹි කළමනාකරණ මණ්ඩල තීරණයක් පරිදි අයකිරීමකින් තොරව නාවික හමුදාව වෙත පවරාදීමට අනුමැතිය ලබාදී තිබුණි. 2023 ජනවාරි 01 දිනට ශුද්ධ අගය රු. 985,210 ක් වූ මෙම වත්කම පරිත්‍යාග කිරීම පිළිබඳ ගණුදෙනුවේ ලාභය හෝ අලාභය හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | වත්කමේ ශුද්ධ වටිනාකම ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර සමුච්චිත අරමුදල වෙත ගලපා ඇත. | වත්කම් අපහරණයෙන් පැනනගින ලාභය හෝ පාඩුව හඳුනාගෙන ලාභාලාභ ගිණුම මගින් ගැලපිය යුතු වීම. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම් අනුව නිවාස වාරික මුදල් කලින් ගෙවා ඇති බවට දක්වා තිබුණු පුද්ගලයන් 69 කට අදාල රු.2,702,664 ක් 2023 දෙසැම්බර් 31 දිනට කලින් ලද ශේෂයෙන් ඉවත් කර ඇතත් එය වර්ෂයේ ආදායමට හඳුනාගත් බවට සනාථ නොවීම, 2022 දෙසැම්බර් 31 දිනට රු. 1,464,000 ක ලැබිය යුතු ශේෂයක් පැවති නිවාස හිමියන් 16 කට අදාල ශේෂ 2023 | 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළින් දක්වා නොමැති කලින් ලද මුදල් හා අඩුවෙන් පෙන්වා දි ඇති රු. 100,000 ක මුදල ජ'නල් සටහනක් මගින් නිවැරදි කර ගැනිමටත් වාරික අයකරගැනීම පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමට පියවර ගැනීමට ඉදිරියේදී පැවැත්විමට නියමිත | ආදායම නිවැරදිව හඳුනාගැනීම හා ගිණුම්ගත කිරීම සිදුකළයුතු අතර අදාල තැන්හිදී විස්තරාත්මක උපලේඛණ මගින් එම තොරතුරු සනාථ කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු ශේෂ ලේඛණයෙන් ඉවත් කර තිබීම, 2023 දෙසැම්බර් 31 දිනට කලින් ලද ශේෂය රු.100,000 ක් අඩුවෙන් දක්වා තිබීම, නිවාස වාරික ආදායම් උපලේඛණ ඉදිරිපත් නොවීම ආදිය හේතුවෙන් රණජයපුර නිවාස ව්‍යාපෘතියේ වාරික ආදායම ලෙස දක්වා ඇති රු. 69,323,714 ක වටිනාකම පිළිබඳ නිරවද්‍යතාව තහවුරු නොවුණි. | කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ශේෂය රු. 109,648,125 ක් වුවත් ඊට අදාල උපලේඛණය අනුව ශේෂය රු. 109,677,622 ක් ලෙස රු. 29,497 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන ඇති බැවින් ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් ශේෂ හා උපලේඛනගත ශේෂ වටිනාකම් සමාන විය යුතු වීම. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අර්ධ හා පූර්ණ නිවාස ප්‍රතිලාභීන් වෙත වාරික ගෙවීම. | 7,780,412 | ප්‍රතිලාභ මුදල් අදාල ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට සනාථ වන ලේඛන. | ප්‍රතිලාභීන් වෙත සිදුකරන ලද ගෙවීම් වලට අදාළව ප්‍රතිලාභියාගේ අත්සනින් යුතුව මුදල් ලද බවට සනාථ කිරීමේ ලිපියක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, තවදුරටත් ප්‍රතිලාභීන්ගෙන් සනාථ ලිපි ලැබෙමින් පවතී. | මුදල් රෙගුලාසි 264(1) ප්‍රකාරව කටයුතු කර සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් දල මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියක් මගින් තහවුරු කරගත යුතු වීම. |
| (ආ) | ලැබියයුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම. | 21,840,910 | ලැබියයුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම සඳහා ශේෂ සනාථ කිරීම්. | පිළිතුරු ලබා දී නොමැත. | ලැබියයුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම සඳහා අදාල ආයතන මගින් ශේෂ සනාථ කිරීම් ලබාගත යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල උපලබ්ධිකර තිබූ ස්ථාවර තැන්පතු 06 කට අදාල පොලී ආදායම | 19,330,990 | මෙම පොලී ආදායමට අදාල මූලාශ්‍ර ලේඛණ සහ පොලිය ගිණුම්වල සටහන් කිරීම සඳහා පදනම් කරගත් ලේඛණ | මින් ඉදිරියට ස්ථිර තැන්පතුවක් උපලබ්ධි කිරීමෙන් පසු එහි තහවුරුවක් අදාළ බැංකුව වෙතින් ලබාගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොලී ආදායමට අදාල අනුරූප උපලේඛණ හා වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට රණජයපුර නිවාස හිමියන්ගෙන් අයවියයුතු හිඟ වාරික මුදල රු. 43,503,101 ක් වූ අතර එයින් වර්ෂ 1සිට 5 දක්වා කාලයක් හිඟහිටි ශේෂයන්ගේ එකතුව රු. 26,220,080 ක් වූ අතර වසර 05 ට වැඩි කාලයක් හිඟහිටි ශේෂ එකතුව රු. 2,792,000 ක් විය. මෙම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි. | විශ්‍රාම ගැනීම, නිවාඩු නොමැතිව රාජකාරියට නොපැමිණීම, සේවය හැරයාම, මියයෑම, බන්ධනාගාර ගත කිරීම වැනි අවස්ථා හේතුවෙන් දීර්ඝකාලීන හිඟ වාරික මුදල් පවතී. මේ පිළිබඳව ත්‍රිවිධ හමුදා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර එහි නිර්දේශයන් කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර කඩිනමින් ඒ පිළිබඳව ක්‍රියා කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන අප්‍රමාදව වාරික අයකර ගැනීමට හා යාවත්කාලීන ලේඛණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු. 21,840,910 ක් වූ අතර ගිවිසුම් අනුව පූර්ව මාසයට අදාල කුලී මුදල ඊළඟ මාසය තුළ අයකරගත යුතු වුවත් රු. 13,312,710 ක අයවිය යුතු කුලී මාස 02 සිට 15 දක්වා කාලයක් ප්‍රමාදවී පැවතුණි.<br>අරමුදලට අයවිය යුතු ආදායම් බාහිර ආයතන තුළ සැලකිය යුතු කාලසීමාවක් රැඳී පැවතීම, අරමුදල් ආයෝජන අවස්ථා අහිමිවීමට හා ද්‍රවශීල මුදල් අවශ්‍යතා ඉටු කිරීමේදී ගැටළු මතුවීමටද හේතුවී තිබුණි. | සෑම මසකම අවසානයේදි අදාල සමාගම් වෙත වාචිකව හා ලිඛිතව දැනුවත් කරන අතර, කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් ප්‍රකාරව අප්‍රමාදව කුලී ආදායම් රැස්කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | සම්ප්‍රේෂණ කුළුණු වලට අදාල ඇතැම් සමාගම් සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම්වල ගාස්තු නියමිත දිනට නොගෙවීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කර නොතිබුණු අතර ඇතැම් සමාගම් සමඟ පවතින අවබෝධතා ගිවිසුම් අනුව හිඟ බිල්පත් සඳහා දඩ මුදල් අයකළ යුතු වුවත් එසේ අයකළ බවට තහවුරු නොවුණි. | ගිවිසුම් අනුව අදාළ මාසය අවසානයේදීම කුළුණු ආදායම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ඇතිකර ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී හිඟ ආදායම් සම්බන්ධ ප්‍රමාණවත් වගන්ති ඇතුළත් කර ඊට අනුරූපව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | රණජයපුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 21 හි බදු ගිවිසුම් ප්‍රකාරව මාසික බදු කුලිය අදාල මාසයේ 25 දිනට පෙර අයවිය යුතු වුවද 2023 දෙසැම්බර් 31 | 2023.12.31 වන දිනට පමණක් කාල විශ්ලේෂණය කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023.01.01 දිනට ලැබිය යුතු රු.297,260ක මුදල ඉදිරි | ගිවිසුම් ප්‍රකාරව නියමිත දින මාසික බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළයුතු |

| | | |
|---|---|---|
| දින වන විට හිඟ කුළිය රු.483,960 ක් වූ අතර ඉන් රු.218,150 ක් සඳහා පමණක් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර තිබුණි. | ගිණුම් කටයුතු වලින් ජ'නල් සටහන් මගින් නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කර ගනු ලැබේ. | වීම හා යාවත්කාලීන කළ වාර්තා පවත්වා ගත යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 09 වන වගන්තිය | පූර්වෝක්ත වගන්තියේ දැක්වෙන පරිදි අරමුදල විසින් "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් පවත්වාගත යුතු අතර එකී පනතේ 7 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු මුදල් එකී ගිණුමට බැර කරනු ලැබිය යුතු වුවත් අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් පවත්වා නොතිබුණි. | අරමුදලේ සම්ප්‍රේෂණ කුළුණු ආදායම්, නිවාස වාරික, කඩකාමර බදුකුලි සහ පරිත්‍යාග මුදල් ආදිය රැස්කිරීම වානිජ බැංකුවල පවත්නා ගිණුම් හරහා සිදුවන බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ගිණුමක් විවෘත කල හොත් ප්‍රායෝගිකව ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවේ. | පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 10 වන වගන්තිය හා 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2022 අංක 45 දරන දේශීය ආදායම් පනත් මගින් සංශෝධනය කළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව අරමුදලේ ස්ථාවර තැන්පතු මත පොලි ආදායමෙන් සියයට 05 ක රඳවාගැනීම් බදු ලෙස රු.13,771,820 ක් අයකර තිබුණු අතර එම රඳවාගැනීම් බදු මුදල අරමුදලේ වියදමක් ලෙස වර්ෂයේ අතිරික්තයට එරෙහිව ලියාහැර තිබුණි.<br>අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව, දේශීය ආදායම් පනතින් අවසර දෙනු ලබන ප්‍රමාණයට අරමුදලේ ආදායම හෝ ලාභය මත ගෙවිය යුතු ආදායම් බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතුවේ. බදු බැදියාවක් පවතීද යන්න තහවුරු කර ගැනීමක් හෝ අදාල බැංකු වෙතින් රඳවාගැනීම් බදු අඩු නොකරන ලෙසට ඉල්ලීමක් හෝ සිදුකර නොතිබුණි. | අරමුදල් පනතේ 10 වන වගන්තියෙන් දක්වා ඇති පරිදි මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් ආදායම් බදු නිදහස් කිරීම සනාථ කර ගැනීම හා එය රඳවා ගැනීමේ අනුනියෝජිතයා (බැංකු) වෙත ඉදිරිපත් කර බදු රඳවාගැනීමේ අවශ්‍යතාවයෙන් මුදාහරින ලෙස ඉල්ලීමක් කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 04 හි 3 ඡේදය. | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබද කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2023 වර්ෂය සදහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කලහැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තා කාර්තුව අවසන් වී දින 15 කට ප්‍රථමයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතද පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අරමුදලේ ප්‍රගතිය පිළිබද කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 04 හි 2.2 ඡේදය | අරමුදලෙහි ආදායම් හඳුනාගැනීමේදී ලැබීම් වවුචර, ලදුපත්, ඉන්වොයිසි, ආදී මූලාශ්‍ර ලේඛණ භාවිතාකර නොතිබුණු අතර බැංකු ප්‍රකාශනයේ බැරට දැක්වෙන වටිනාකම් මත සියළුම ආදායම් හඳුනාගෙන තිබුණි. | සෘජුවම මුදල් බැරකරන පුද්ගලයින්ගේ බැරපත් මෙම අරමුදල වෙත ඉදිරිපත් කරනු ලබයි. තවද, සන්නිවේදන කුළුණු ආදායම් ලබාගැනීමේදී ඉන්වොයිස් හා ගිවිසුම් වල සඳහන් වටිනාකම් සැලකිල්ලට ගනිමින් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | ගිණුම් තොරතුරු සනාථවන පරිදි මූලාශ්‍ර ලේඛණ සහිතව ගිණුම්වල සටහන් කල යුතු වීම. |
| (ඉ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 4හි 5.2 හා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01(21) | අරමුදලක මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන සංරචකයක් ලෙස ස්කන්ධ වෙනස්වීම්/ශුද්ධ වත්කම පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයක් අන්තර්ගත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී අරමුදලේ ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 7 හි 04 ඡේදය | අදාල ගිණුම් වර්ෂය සඳහා අනුමත වි ඇති අයවැය සීමාවන් හා සත්‍ය සීමාවන් සැසඳිමක් කර විචලනයන් සඳහා හේතු ද සමඟ අයවැය (සාරාංශගත කළ) සැසඳුම ලේඛණය ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු වුවද එවැනි විචලන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ගිණුම් වර්ෂය සඳහා අනුමත වී ඇති අයවැය සීමාවන් හා සත්‍ය සීමාවන් සැසඳීමක් කර විචලනයන් සඳහා හේතුද සමඟ (සාරාංශගත කළ) අයවැය සැසඳුම් ලේඛණය ඉදිරි වර්ෂයේ සිට ගිණුම් සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් මහජන පරිත්‍යාග රැස්කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුනක 2018 වර්ෂයේ සිට 2023 දක්වා කාලය තුළ ලැබුණු එකතුව රු. 1,081,793 ක පරිත්‍යාග මුදල් ශේෂව පැවතුණි. මෙම ගිණුම් ආශ්‍රිතව වර්ෂය තුල හෝ පූර්ව වර්ෂයන්හිදී කිසිදු ගෙවීමක් සිදුකර නොමැති බැවින් අවම තැන්පතුවක් පවත්වා ගනිමින් අතිරික්ත මුදල් ඵලදායි ආයෝජනයක යෙදවීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ජංගම ගිණුම් වල පවත්වා ගතයුතු අවම මුදල් ශේෂයන් ඉතිරිවන පරිදි අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් හා ඵලදායී අරමුදල් කළමනාකරණයක් පවත්වාගත යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 75,144,999 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 398,875,766 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 323,730,767 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා ව්‍යාපෘති සංවර්ධන වියදම රු.412,925,191 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රණජයපුර නිවාස සංකීර්ණයේ නිවාස සඳහා සාමාජිකයන් 69 ක් වාරික මුදල් ගෙවා අවසන් බවට වාර්තාගතව පැවති අතර දෙපාර්ශවය විසින් එළඹි ගිවිසුමේ 2 වන වගන්තිය ප්‍රකාරව වාරික ගෙවා අවසන් කළ සාමාජිකයන් වෙත නිවාසවල අයිතිය පැවරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් අමාත්‍යාංශය යන රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී රණජයපුර නිවාසලාභීන් සඳහා හිමිකම් සහතික ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව 2023 වර්ෂය අවසාන වන විට අර්ධ නිවාස 379 ක් හා පූර්ණ නිවාස 29 ක් සඳහා රු.423,275,789 ක ආධාරමුදල් ගෙවා අවසන් කිරිමට සැළසුම් කර පැවතියද 2023 දෙසැම්බර් 31 දින වනවිට | ඉදිකිරීම් පිළිබඳ ප්‍රායෝගික ගැටළු පවතින නිසා ඇතැම් ප්‍රතිලාභීන්ගේ වාරික තවදුරටත් ගෙවිය යුතුව පවතී. කෙසේ වුවද තවදුරටත් ගෙවිය යුතු මෙම මුදල | ක්‍රියාකාරි සැලැස්මට අනුගතව කටයුතු කළ යුතු වීම. |

තවදුරටත් රු.106,613,263 ක් සහ 2021 වර්ෂය ගෙවීම සඳහා කඩිනමින් කටයුතු වෙනුවෙන් රු.3,034,862 ක් ගෙවිය යුතුව කරන බව කාරුණිකව දන්වමි. පැවතුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් නිවාස ප්‍රතිලාභ ගෙවීමේදී අදාල ප්‍රතිලාභියාට සෘජුවම මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් වෙනුවට අදාල හමුදා ගිණුම් වෙත මුදල් මුදාහැරීම සිදුකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී එකතුව රු. මිලියන 333.9 ක මුදල් නිදහස් කර ඇතත් එම මුදල් නියමිත ප්‍රතිලාභියා වෙත නිශ්චිත දිනයේදී ලැබුණු බවට අප්‍රමාදව සහතිකවන ක්‍රමවේදයක අවශ්‍යතාව 2021 වර්ෂයේ සිට අවධාරණය කර ඇතත් සමාලෝචිත වර්ෂය දක්වාම විධිමත් පරිදි ක්‍රියාත්මකව නොතිබුණි. | පරිපාලනමය කටයුතු පහසුකිරිම උදෙසා අදාළ ප්‍රතිලාභින් තෝරා ගැනිම හා නිල ගිණුම් මගින් ප්‍රතිලාභින් වෙත මුදල් ලබාදීම ත්‍රිවිධ හමුදා හා පොලිසිය මගින් සිදුකරනු ලැබේ. ඉදිකිරීම් සිදු කර ඇති බවට ග්‍රාමසේවා නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, අදාළ හමුදාවේ ඒකක අණදෙන නිලධාරී, සුභසාධක අධ්‍යක්ෂ නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි. | ප්‍රතිලාභ මුදල් නියමිත ප්‍රතිලාභියා වෙත නිශ්චිත දිනයේදී ලැබුණු බවට ප්‍රමාදයකින් තොරව හා නිවැරදිව ප්‍රතිලාභීන්ට මුදල් ලැබෙන බවට සහතිකවන ක්‍රමවේදයක් ක්‍රියාත්මත කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාෂරීක කායර්සාධන වාතර්ාව පාලරීමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් අරමුදල ආරම්භයේ සිට 2022 වර්ෂය දක්වා වූ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා අරමුදල ආරම්භයේ සිටම සභාගත කිරීමක් සිදුකර නොමැති අතර මේ වන විට අදාළ ආයතන හා සම්බන්ධීකරණය වී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | පනතේ වගන්ති ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකළ යුතු වීම. |